(21)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය எனது இல. My No.	ඔබේ අංකය உமது இல. Your No .	දිනය திகதி Date. 2025 . 05 . 28

ඩබ්.එස්.කේ.හේවාවසම්
අභ්‍යන්තර විගණන නිලධාරී,
මහ නගර සභාව,
රත්නපුර.

පැමිණිලිකාර පාර්ශවය

අධ්‍යක්ෂ,
නාගරික සංවර්ධන අධිකාරිය,
සබරගමුව පළාත් කාර්යාලය,
නව නගරය,
රත්නපුර.

වගඋත්තරකාර පාර්ශවය

<u>පැමිණිලි අංකය : HRC/3651/23</u>

<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, ඔහු 2013 වසරේදී ඉඩමක් මිලදී ගෙන නිවසක් ඉදිකිරීමට උත්සාහ දරන අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශවය විසින් එකී ඉඩම පොදු මහජන කටයුත්තක් උදෙසා අත්පත් කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටින ලද බවත්, ඒ අනුව තමාට නිවසක් තැනීමට එම ඉඩම භාවිතා කළ නොහැකි වූ බවත් ය. එසේම, ඉහත සඳහන් පරිදි අත්පත් කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිය ද මේ දක්වා එම ඉඩම වගඋත්තරකාර පාර්ශවය විසින් අත්පත් කර ගැනීමක් ද සිදු කර නොමැති බැවින් තමා හට වන්දි මුදලක් ලබා දෙන ලෙසත්, වගඋත්තරකාර ආයතනයන්හි නිලධාරීන් ද්වේශ සහගතව කටයුතු කර තිබේනම් ඊට එරෙහිව අවශ්‍ය පියවර ගන්නා ලෙසත් පැමිණිලිකරු විසින් ඔහුගේ පැමිණිල්ල තුළින් ඉල්ලා ඇත.

එසේම, රත්නපුර නගරාසන්නයේ පිහිටි ඉහත කී ඉඩම 2013 වසරේදී මිලදී ගන්නා ලද්දේ නිවසක් තනා ගැනීම සඳහා බවත්, එම ඉඩම මිලදී ගැනීමට හා සංවර්ධනය කිරීමට වෙනත් පැමිණිලිකරු සතු නිවාස දෙකක් විකුණා මුදල් ලබාගත් බවත්, එහෙත් තමා අපේක්ෂා කළ පරිදි අදාළ ඉඩමේ නිවසක්

ප්‍රධාන කාර්යාලය பிரதான அலுவலகம் Head Office	අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. No. 14, R.A.De Mel Mawatha, Colombo -04.	සභාපති தவிசாளர் Chairman	011- 2505451	ෆැක්ස් தொலைநகல் Fax	011- 2505541/74	ඊමේල් மின்னஞ்சல் e-mail	sechrcsl@gmail.com
දුරකථන தொலைபேசி Telephone	94-11-2505580 / 81 /82	ලේකම් செயலாளர் Secretary	011- 2505521	ක්ෂණික துரித அழைப்பு Hotline	1996	වෙබ් இணையம் Web	www.hrcsl.lk

තනා ගැනීමට නොහැකි වීමෙන් වසර 10ක් පමණ කුළී ගෙවල් වල හා මහ නගර සභාවේ නිල නිවාස වල දරුවන් සමඟ ගැටළු රාශියකට මුහුණ දෙමින් ජීවත් වන්නට වූ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, තමා රත්නපුර මහ නගර සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරී ලෙස කටයුතු කිරීමේ දී ඇතිකර ගත් අමනාපයක් මත රත්නපුර නාගරික සංවර්ධන අධිකාරියේ එක් නිලධාරිනියක් ද්වේශ සහගතව හා උපක්‍රමශීලීව කටයුතු කරමින් මෙම ඉඩමේ නිවසක් තැනීමට නොහැකි වන ආකාරයට බාධා පමුණුවන ලද බවත්, තමා ඒ පිළිබඳව වගඋත්තරකාර නිලධාරීන් දැනුවත් කළ ද සාධාරණ පියවරක් ගෙන නොමැති බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේම, එලෙස අමනාප වීමට හේතුව වන්නේ රත්නපුර මහ නගර සභාවේ සැලසුම් කමිටුවට නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් එකී නිලධාරිනිය ඉදිරිපත් වෙමින් නගර සභාවට අයත් වටිනා දේපළ රැසක් බාහිර පුද්ගලයින්ගේ නම් වලට සැලසුම් අනුමත කර දී අවභාවිත කිරීම සම්බන්ධව පැමිණිලිකරු සිදු කළ විගණන පරීක්ෂණ වලින් තහවුරු වීමෙන් පසුව ඊට එරෙහිව විනය පරීක්ෂණ සිදු කර දඩුවම් පමණුවා තිබීම බව ද පැමිණිලිකරු පැමිණිල්ලේ දක්වා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකරු වන නාගරික සංවර්ධන අධිකාරියේ සබරගමුව පළාත් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් අංක : 27/RAT/09/1 සහ 2023.10.02 දිනැති වාර්තාව මගින් මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කර ඇත. එහි දක්වා ඇත්තේ රත්නපුර - පානදුර ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 200ක් පමණ දුරින් මාර්ගයට දකුණු පසින් මාර්ගයට අඩි 10ක් පමණ පහලින් විෂය ගත දේපළ වන ලේන්තැඩියේ කුඹුර නම් පහත් බිමක් පිහිටා ඇති බවත්, එය පැරණි කුඹුරු ඉඩමක් ලෙස තිබුණද පසුව වගාව අතහැර දමා තිබූ එකක් බවත්, ප්‍රධාන මාර්ගයේ සිට බැලීමේදී ඉඩමට වම් පසින් ඇළ මාර්ගයක් පිහිටා ඇති බවත්, රත්නපුර ශික්ෂණ රෝහල ඇතුළු අවට පිහිටි උස් බිම් වල ජලය බැසයාම සහ අධික වර්ෂාව සහිත දින වල ජල රැඳවුම් ප්‍රදේශයක් ලෙස පවතින පහත් බිමක් ලෙස පවතින බවත්, මෙම භූමිය තුළ අනවසර ඉදිකිරීම් හා ගොඩ කිරීම් පවතින බවත්, ඊට එරෙහිව වරින් වර නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ය.

රත්නපුර නගරය සහ අවට පහත් බිම් ගං වතුර තර්ජන වලට ලක් වන අවස්ථා වලදී මෙවැනි පහත් බිම් ජල රඳවන භූමි ලෙස තිබීම වාසිදායක වන බැවින් අනවසර ඉදිකිරීම් හේතුවෙන් සිදුවන හානිය වළක්වා ගැනීමට සුදුසු ස්ථාන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ස්ථාන හඳුනාගෙන ඇති බවත්, ඒ අනුව රත්නපුර නගර සංවර්ධන සැලැස්මේ කමිටු රැස්වීම් වල තීරණය පරිදි නගර සභා බලසීමාව තුළ පිහිටි හඳුනා ගත් සියළු පහත් බිම් හා කුඹුරු ඉඩම් පාරිසරික සංවේදී කලාපය ලෙස නම් කළ සැලැස්මක් 2014 වසරේදී පිළියෙල කර එය අංක 1884/25 හා 2014.10.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ විස්තර කර කලාපීයකරණ සැලැස්ම ද ඉදිරිපත් කරන ලද බවත් ඉහත කී වාර්තාව තුළ දක්වා ඇත.

එසේ තිබියදී ලේන්තැඩිය නම් කුඹුරු ඉඩමේ හිමිකරු අක්කර 02 රූඩ් 00 පර්චස් 27ක් පමණ විශාල වූ කුඹුරු ඉඩම කොටස් කර විකුණා ඇති බවත්, පැමිණිලිකරු ද ඉන් පර්.16.5ක් මිලදී ගත් බව අනාවරණය වූ බවත් වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. පසුව පැමිණිලිකරු විෂයගත දේපළ සංවර්ධනය කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් සිදු කළ පසු වගා කටයුතු හැර වෙනත් කාර්යයකට භාවිත කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් අංක 7/11/13/RP/577 සහ 2016.08.22 දිනැති ලිපිය මගින් අවසර ලබා දී ඇති බවත්, එහෙත් නිවසක් ඉදි කරන්නේ නම් රාජ්‍ය ආයතන කිහිපයකින් අවශ්‍ය පරිදි අවසරය ලබාගනිමින් කණු මත ඉදි කළ යුතු බවට එකී ලිපියේ දක්වා තිබූ බවත්, නගර සංවර්ධන සැලැස්මට අනුව අදාළ ඉඩම පරිසර සංවේදී කලාපයක් ලෙස නම් කළ ස්ථානයක් බැවින් ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අවසරය ලබාදී නැති බවත් වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

මහජන පැමිණිලි දිගින් දිගටම පැමිණීමෙන් අනතුරුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව නිකුත් කළ ඉහත කී අවසර පත්‍රය තාවකාලිකව අවලංගු කළ බවත්, එම තත්ත්වය මත පැමිණිලිකරු හට අදාළ ඉඩම තුළ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කළ නොහැකි වී ඇති බවත් වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

2014 වර්ෂයේදී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද රත්නපුර නගර සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කළ පසු 2019 වසරේදී නගර සංවර්ධන සැලැස්ම ගැසට් ගත කිරීමට නියමිතව තිබුණ ද රත්නපුර මහ නගර සභාවේ කැමැත්ත පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් මත සංශෝධනයකට යටත්ව ලබාදී තිබූ බවද මෙම කුඹුරු ඉඩම පිහිටි ස්ථානයට සමගාමීව ප්‍රධාන මාර්ගයට ආසන්න අඩි 200ක් හෝ 250ක් වූ දැනට පවතින සංවේදී කලාපයෙන් ඒ ප්‍රමාණය නිදහස් කර නගර සැලැස්ම ගැසට් ගත කිරීමට අනුමැතිය ලබාදී තිබී ඇත. නගර සංවර්ධන සැලැස්ම සංශෝධනය කළයුතු ආකාරය පිළිබඳ තීරණය කළ පසු එකී සංශෝධන අදාළ සැලැස්මට ඇතුළත් කළ ද සංශෝධන සම්බන්ධව නැවත සළකා බැලීමක් කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් අධ්‍යක්ෂක විසින් කළ ඉල්ලීමක් අනුව පැමිණිල්ලේ විෂය ගත ඉඩම පිහිටි ස්ථානය රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙක් එක්ව ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ ස්ථානයක් බවද එකී සියළුම කමිටු සාමාජිකයින්ගේ තීරණය වූයේ ස්වභාවික සංරක්ෂණ කලාපයට ඇතුළත් වන පරිදි මෙම දේපළ කොටස තබාගතයුතු බව වන බවත්, එබැවින් 2021-2030 දක්වා කාලයට අයත් රත්නපුර නගර සංවර්ධන සැලැස්මට ස්වභාවික රක්ෂණ කලාපයට පැමිණිල්ලේ විෂය ගත දේපළ ඇතුළත්ව ඇති බැවින් අංක : 2236/7 හා 2020.07.13 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ගැසට් ගත කරන ලද ස්ථානයක් බව තීරණය කරන ලද බවත් වගඋත්තරකරු විසින් සිය වාර්තාව මගින් දක්වා ඇත.

පැමිණිලිකරු විසින් 2022 වසරේදී එවකට සිටි ජනාධිපතිතුමා වෙත සහ වගඋත්තරකරුවන් වෙත මෙම පැමිණිල්ලේ විෂයගත කාරණය සම්බන්ධව අවස්ථා ගණනාවකදී කළ ඉල්ලීම් පිළිබඳ දක්වා වන්දි ඉල්ලීම් සිදු කර ඇති අතර රජයට එකී දේපළ පවරාගෙන ඒ වෙනුවට නිවසක් මිලදී ගැනීමට ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදෙන ලෙස පැමිණිලිකරු ඉල්ලීම් කර ඇති බව ද වගඋත්තරකරු සිය වාර්තාව මගින් පෙන්වා දී තිබේ.

ගංවතුර තත්ත්වය පාලනය කර ගැනීමට හා පාරිසරික සංවේදීතාවය ආරක්ෂා කර ගැනීමට පැමිණිලිකරුගේ දේපළ පමණක් නොව මහ නගර සභා සීමාවට අයත් හඳුනාගත් කුඹුරු ඉඩම් හා පහත් බිම් අත්පත් කරගෙන ඇති බැවින් පැමිණිලිකරුට පමණක් සිදු කළ අගතියක් නොවන බවද, පැමිණිලිකරුගේ ඉල්ලීම අනුව මෙම කුඹුරු ඉඩම රජයට පවරා ගැනීමක් සිදු කරන්නේ නම් ලබාදියහැකි වන්නේ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් නියම කරනු ලබන තක්සේරු මුදලක් මිස පැමිණිලිකරු අපේක්ෂා කරන ආකාරයේ වන්දි මුදලක් නොවන බව ද, ඔහුට ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ වඩාත් පැහැදිලි කර දී ඇති බව ද වගඋත්තරකරු සිය වාර්තාවෙන් දක්වා තිබේ.

තවද, යෝජනා කර ඇති පරිසර සංවේදී කලාපය හා තෙත්බිම් උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය දැනට තාවකාලිකව ක්‍රියාත්මක නොවන නමුත්, එය රජයේ ආර්ථික ස්ථාවරත්වය අනුව ක්‍රියාත්මක කිරීමට තීරණය කළ පසු දේපළ රජයට පවරා ගැනීමක් සිදු කිරීම සම්බන්ධව සළකා බැලියහැකි බව ද රජයේ තක්සේරුගත වටිනාකම ලබාගැනීමට ඇති අවස්ථාව සම්බන්ධව එකඟතාවයක් ලබාදෙන ලෙස දැනුවත් කළ ද මෙතෙක් ඒ සඳහා ප්‍රතිචාරයක් ලැබී නොමැති බව ද වගඋත්තරකරු විසින් පෙන්වා දී තිබේ.

<u>පරීක්ෂණයේදී අනාවරණය කර ගන්නා ලද කරුණු</u>

පැමිණිලිකරු විසින් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද්දේ පහත සඳහන් කරුණු ය.

පැමිණිලිකරු රත්නපුර මහ නගර සභාවේ අභ්‍යන්තර විගණක ලෙස රාජකාරී කටයුතු කරන බවත්, අනුරාධපුරය ප්‍රදේශයේ සිට වසර 22කට පෙර රත්නපුර ප්‍රදේශයට පැමිණ රැකියාව කිරීම සඳහා පදිංචි වූ බවත්, 2013 වසරේදී තමා සතුව තිබූ නිවාස 02ක් විකුණා සහ සන්තකයේ තිබූ මුදල් එකතු කර රත්නපුර නගරාශ්‍රිතව මිලදී ගන්නා ලද මෙම පැමිණිල්ලේ විෂය ගත දේපළ නිවසක් තැනීමට මිලදී ගන්නා ලද එකක් බවත්, ඒ අනුව ඉහත කී මුදල් ද බැංකු මගින් ලබාගන්නා ලද ණය මුදල් ද සමඟ එකතුව රු4,410,000/-ක මුදලක් මෙම දේපළ වෙනුවෙන් වැය කළ බවත් කියා සිටී.

ඉඩම මිලදී ගැනීමට පෙර පත්ඉරු පරීක්ෂා කොට වසර 110කට වඩා වැඩි පෙළපතක් සහිත සින්නක්කර අයිතිය ඇති ඉඩමක් වූ බැවින් ද වසර 60කට වඩා පුරන්ව තිබූ එහෙත් පැරණි කුඹුරු ඉඩමක් වුවද රත්නපුර අධි නාගරික කලාපය තුළ පිහිටි වාණිජ වටිනාකමකින් ඉහළ ඉඩමක් බැවින් ද එය මිලදී ගත් බව ද කියා සිටී. ඔප්පුවේ උපලේඛනයේ කුඹුර යන වචනය පවතින බැවින් නිවස තැනීමට පෙර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ඔහුගේ අංක :7/11/4/45 දරණ

චක්‍රලේඛය ප්‍රකාරව නිවස තැනීමට නිසි අවසරයක් පළමුව ලබාගත් බව ද ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රයට සමගාමීව වෙනත් රේඛීය ආයතන වල අවසර ලාභී බලපත්‍ර 2015 වසර වන විට ලබා අවසන්ව තිබියදී ඉතිරිව තිබුණේ රත්නපුර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ලබාගතයුතු නිසි අවසරය ලබා ගැනීම පමණක් බව පෙන්වාදෙන ලදි. එහෙත් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් පැමිණිලිකරු සමඟ ඇති කර ගන්නා ලද පුද්ගලික අමනාපයක් මත ද්වේශ සහගතව ක්‍රියා කර තම නිවස තනා ගැනීමට අවසන් අවසරය ලබා නොදීම මෙම පැමිණිල්ල ඇතිවීමට හේතුවක් වූ බවත්, 2016 වසරේ දී නිත්‍යානුකූල ලෙස ගොවිජන සේවා බලපත්‍රය ලබා තිබියදී එහි එක් කොන්දේසියක් වන ඉඩමේ ප්‍රදර්ශනය කළයුතු දැන්වීම් පුවරුව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිනියන් දෙදෙනෙකු විසින් ගලවා තමා සේවය කරන ආයතනයට පැමිණ අපහාසාත්මකව හැසිරීම මත තමාගේ සේවා ආයතනයේ ප්‍රධානියා විසින් රත්නපුර නාගරික සංවර්ධන අධිකාරියේ ආයතන ප්‍රධානියා හට කරුණු දක්වා එය දෝෂ දර්ශනයට ලක් කිරීම හේතුවෙන් හට ගත් අමනාපයක් ඊට හේතු වූ බවත් පැමිණිලිකරු විසින් පෙන්වා දෙන ලදි.

තවද, 2014 වසරේ රත්නපුර නාගරික සැලැස්මේ පාරිසරික සංවේදී කලාපය තුළ මෙම ඉඩම පිහිටා තිබෙන බැවින් එම කලාප වල නිවාස ඉදි කිරීමට අවසර ලබා නොදෙන බව ප්‍රකාශ කළ ද අවසර දී ඇති බව තම පැමිණිල්ලේ කරුණු සහිතව තහවුරු කර ඇති බව පෙන්වා දෙන ලදි. පැමිණිලිකරු විසින් සිදු කළ අභ්‍යන්තර විගණන අනුව රත්නපුර මහ නගර සභාවට අයත් වටිනා දේපළ රැසක් 2013, -2016 කාල පරිච්ඡේද තුළ බාහිර පුද්ගලයින්ගේ නම් වලට සැලසුම් අනුමත කර දී තිබීම මත පරීක්ෂණ කටයුතු සිදු කිරීම ද මෙම ද්වේශ සහගත අමනාපයට හේතුවක් වී ඇති බව ද කියා සිටී. පැමිණිලිකාර තමා සමඟ ඉඩම් මිලදී ගත් තම ඉඩමට යාබද තැනැත්තන් කිහිප දෙනෙකුගේම නිවාස ඉදිකිරීමට අනුමැතිය ලබාදී තමාට පමණක් ඒ සඳහා කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කොට වෙනස් කොට සලකන ලද බව පරීක්ෂණ අවස්ථාවේදී කියා සිටී. මෙම ක්‍රියා කලාපය ලිඛිතව නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය දක්වාම ඉදිරිපත් කර නිවාසය තනා ගැනීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ද එහෙත් ඒ සඳහා ද සහනයක් ලැබී නොතිබුණු බව ද පැමිණිලිකරු කියා සිටී.

2018 වසරේ දී පැමිණිලිකාර තමාගේ ඉඩම පරීක්ෂා කර බලා නිවාසය තැනීමට යම් කොටසක් නිදහස් කර දෙන ලෙස රත්නපුර නගරයේ නාගරික සංවර්ධන අධිකාරී කාර්යාලයේ පැවති විෂය භාර අමාත්‍යවරයා හා ඉහළ බලධාරීන් අතර තිබූ කමිටු තීරණයේ දී දන්වා තිබුණද එකී තීරණයට අනුව ද සහනය ලබා නොදුන් බව කියා සිටී. පසුව තෙත් බිම් උද්‍යානයක් හරහා නගර සංවර්ධන සැලැස්ම සංශෝධනය කර කටයුතු කළ බව ද උපක්‍රම ශීලීව සහ ද්වේශ සහගතව එකී කටයුතු සිදු කරන බව පෙනී ගිය බව ද එබැවින් තමාගේ බිම් කොටස රජයට පවරාගෙන වසර 10ක් පමණ යනතුරු නිවස තැනීමට ඉඩ ලබා නොදුන් බැවින් සාධාරණ වන්දි මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ද ප්‍රකාශ කර තිබේ.

එහෙත් එවකට ගරු ජනාධිපතිතුමා වෙතින් සිදු කළ ඉල්ලීම් වලට අනුව අවසන් වශයෙන් දක්වා ඇත්තේ ඉඩම පවරා ගැනීමට කැමති බව ද ඊට අදාළ කාලසීමාවක් ප්‍රකාශ කළ නොහැකි බව ද කුඹුරු ඉඩමක් ලෙස ඔප්පුවේ උපලේඛනයේ පවතින බැවින් ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන තක්සේරුව මත වටිනාකම ගෙවිය හැකි වුවද කුඹුරු ඉඩමක් මත ගෙවනු ලබන තක්සේරුව ඉතා අඩු එකක් විය හැකි බව ය. ඒ අනුව ඊට ලිඛිත එකඟතාවයක් ඉල්ලා සිටින බවද එහිදී කුඹුරු නාමය පැවතීම මත පර්.1ක් රු.10,000ක් පමණ අඩු අගයක් වියහැකි බවද දක්වා සිටි බව කියා සිටින අතර ඉඩම මිලදී ගැනීමට රු.9,800,000/-ක මුදලක් වැය කර තිබෙන බව ද පැමිණිලිකරු කියා සිටී. මේ වනවිට පැමිණිලිකාර තමා විශ්‍රම ගැනීමට ආසන්න බැවින් ද බිරිඳ හා අධ්‍යාපන කටයුතු සිදු කරන දරුවන් සමඟ නිවසක් නොමැතිව රජයේ නිල නිවාසයක සිටියද එකී නිල නිවස ද රජයට භාර දීමට සිදුවූ පසු තවත් ගැටළු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වූ බැවින් ද වෙළඳපල වටිනාකමට අනුව ගොඩ ඉඩමක් ලෙස සළකා බලා තම දේපළට අදාළ වන්දි ලබා ගැනීමට සහන සලසන ලෙසට පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින ලදී.

වගඋත්තරකරු විසින් දක්වා ඇත්තේ, තමා විසින් ඉදිරිපත් කළයුතු කරුණු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බවත්, 2021-30 රත්නපුර නව නගර සැලැස්මට අනුව මෙම දේපළ කොටස හා යාබද තවත් කුඹුරු ප්‍රදේශ ස්වභාවික සංරක්ෂණ කලාප ලෙස නම් කර ඇති බවත්, ඉදිකිරීම් කටයුතු හැර එකී දේපළ හිමිකරුවන්ට කොන්දේසි මත භාවිතා කිරීමට පමණක් නිර්දේශ කර ඇති බවත් ය. තවද, මෙම ලේන්තැඩිය කුඹුර නම් භූමියට අදාළ කුඹුරු කොටසේ ඉදිකිරීම් කටයුතු සඳහා පැමිණිලිකරු කරුණු ඉදිරිපත් කළ ද ඒ පිළිබඳ පරීක්ෂණ අවස්ථාවේදී සොයා බැලීමකින් තොරව කරුණු කියා සිටිය නොහැකි බව දක්වා සිටී.

තවද, කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේ දී පැමිණිලිකරු නිවාසය තැනීම සඳහා අවසරය ලබාදීමේ සහනය ලබා ගැනීමට එකඟ නොවන බවත්, සිදුව ඇති අසාධාරණය සම්බන්ධයෙන් කෝටි 05ක වන්දි මුදලක් තමාට අවශ්‍ය බවත් ය. තවද පැමිණිලිකරු සමඟ සමාන තත්ත්වයෙන් බලපෑමකට ලක් වන පැමිණිලිකරුගේ දේපළට යාබදව තවත් දේපළ හිමිකරුවන් තිදෙනෙකු ද පැමිණ සිටින අතර ඔවුන් මෙම පැමිණිල්ලේ පාර්ශවයක් නොවන බැවින් ඒ පිළිබඳ කොමිෂන් සභාවේ අවධානයට යොමු කර තීරණයක් ගතයුතුව පවතින බව ද නැතිනම් ඔවුන් විසින් ස්වාධීනව පැමිණිලි කිරීමෙන් අනතුරුව මෙකී පැමිණිල්ල සමඟ සළකා බැලියහැකි බව ද පෙන්වා දී ඇත. පැමිණිලිකරු සමඟ පැමිණි අගතියට පත් ඉතිරි තිදෙනා ද ඉල්ලා සිටින්නේ ඔවුන්ට නිවාස තැනීම නොව මූල්‍යමය වශයෙන් අදාළ වටිනාකම ලබාදෙන ලෙස ය. එහෙත් පරීක්ෂණ අවස්ථාව වන විට ද මෙම දේපළ රජයට අත්පත් කර ගන්නා ලද දේපළක් නොවන බව ඔවුන් හට පෙන්වා දී ඇත.

නිරීක්ෂණ හා නිගමන

පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් ඉදිරිපත් කර සිටින කරුණු සහ වගඋත්තරකරු විසින් යොමු කරන ලද වාර්තා ද, පරීක්ෂණ අවස්ථා වලදී ඉදිරිපත් වූ කරුණු ද අනුව පහත සඳහන් නිරීක්ෂණ හා නිගමන ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු රත්නපුර මහ නගර සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු වශයෙන් අද දින දක්වා සේවය කරනු ලබන විවාහක එක්දරු පියෙකි. දැනට අවුරුදු 57ක් වයසැති පැමිණිලිකරු විශ්‍රාම ගැනීමට ආසන්න කාල වකවානුවක සිටින අතර වසර 22කට පමණ පෙර රත්නපුර ප්‍රදේශයේ ස්ථිර රැකියාව සඳහා පැමිණ තිබේ.

2013 වසරේදී පැමිණිලිකරු මුදලක් වැය කර පැමිණිල්ලේ විෂය ගත දේපළ මිලදී ගෙන ඇති බව පෙනී යන අතර මෙම දේපළ ලේන්තැඩිය කුඹුර ලෙස හඳුන්වනු ලබන පුරන් වූ කුඹුරු ඉඩමක් බව ද නිරීක්ෂණය වේ. පැමිණිලිකරු ප්‍රකාශ කරන ආකාරයට මෙම විෂය ගත දේපළ මිලදී ගෙන සංවර්ධනය කිරීම දක්වා තම අතැති මුදල් හා බැංකු ණය මුදල් ලෙස 4,410,000/-ක මුදලක් යෙදවූ බව ප්‍රකාශ කර තිබේ.

වසර 60කට වඩා වැඩි කාලයක් පුරන්ව තිබූ එම දේපළ රත්නපුර නගර සභා බල සීමාව තුළ පිහිටා ඇති එකකි. ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් මෙම පුරන් වූ කුඹුරු ඉඩම තවදුරටත් කුඹුරු ඉඩමක් ලෙස සංවර්ධනය කළ නොහැකි බැවින් අංක:7/11/4/45 දරණ චක්‍රලේඛය ප්‍රකාරව නිවසක් තැනීම සඳහා ලබාදී ඇත්තේ වෙනත් අදාළ ආයතන වලින් ලබාගතයුතු අවසර ලබාගැනීම් සිදු කළයුතුය යන කොන්දේසිය මත බව ද පෙනී යයි. වෙනත් අදාළ ආයතන විසින් නිවස ඉදි කිරීම සඳහා අවශ්‍ය අවසරය හෝ බලපත්‍ර ලබා ගැනීම 2015 වසර වන විට අවසන් කර තිබුණ ද රත්නපුර නාගරික සංවර්ධන අධිකාරී කාර්යාලය වෙතින් ලබාගතයුතු අවසරය ලබා නොදීම මෙම පැමිණිල්ල ගොනු කිරීමට ප්‍රධාන හේතුවක් වී තිබේ. පැමිණිලිකරු කියා සිටින්නේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් දීර්ඝ කාලයක් සැලසුම් අනුමත කර නොදීමෙන් නිවස තැනීමට නොහැකි වූ බවත්, එකී කාර්යාලයේ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් ද්වේශ සහගතව කටයුතු කිරීම මීට හේතුවක් වී ඇති බවත් ය. එහෙත් ද්වේශ සහගතව පැමිණිලිකරුට එරෙහිව කටයුතු කළ බව ඔප්පු කිරීමේ ආකාරයක් ගොනුවේ ඇති ලේඛන අනුව තහවුරු නොවන නමුත් දීර්ඝ කාලයක් පැමිණිලිකරුට මෙම විෂය ගත දේපළේ නිවස තැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදීමක් සිදුව නැති බව පෙනී යයි.

2016 වසරේ ගොවිජන සේවා බලපත්‍රයේ සඳහන් කොන්දේසියක් වූයේ ඉඩමේ දැන්වීමක් ප්‍රදර්ශනය කරමින් බලපත්‍රය පිළිබඳ කරුණු දැක්වියයුතු බව ය. ඒ අනුව එකී දැන්වීම සවිකළ පසු නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිනියන් දෙදෙනෙකු එකී දැන්වීම් පුවරුව ගලවා පැමිණිලිකරු සේවය කරන ආයතනයට ගෙනැවිත් පැමිණිලිකරුට අපහාසාත්මක ලෙස හැසිරීම පිළිබඳව පැමිණිලිකරුගේ ආයතන ප්‍රධානියා විසින් එය දෝෂ දර්ශනයට ලක් කර තිබීම පැමිණිලිකරු සමඟ පුද්ගලික

අමනාපයක් ඇති කර ගැනීමට හේතු වූ බව පැමිණිලිකරු දක්වා තිබේ. එහෙත් වගඋත්තරකරුවන් ඉදිරිපත් කර ඇති කරුණු අනුව පෙනී යන්නේ 2014 වසරේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කළ නාගරික සැලැස්මේ දක්වා ඇති පාරිසරික සංවේදී කලාපය තුළ මෙම ඉඩම පිහිටා තිබීම නිවාස ඉදිකිරීමට අවසර ලබා නොදීමට හේතුවක් වී ඇති බව ය. එහෙත් පැමිණිලිකරු විසින් තමා අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කිරීමේදී වගඋත්තරකාර පාර්ශවයට එරෙහිව සිදු කළ විගණන පරීක්ෂණ හේතුවෙන් ඇති වූ ද්වේශ සහගත හේතු තම ඉල්ලීම ඉටු නොවීමට කාරණාවක් වූ බව පෙන්වා දෙන අතර වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන්නේ, ද්වේශ සහගත කරුණු මත පදනම් නොවූ බව ද පරිසර සංවේදී කලාපය තුළ දේපළ පිහිටීම මෙම ගැටළුවට හේතුවක් වූ බව ය. එහෙත් මෙම කුඹුරු යායේ පිහිටි වෙනත් ඉඩම් තුළ නිවාස ඉදිකිරීමට වගඋත්තරකරකාර පාර්ශවය විසින් අවසර ලබාදී ඇති බව පැමිණිලිකරු පෙන්වා දෙන අතර වගඋත්තරකරුවන් කියා සිටින්නේ, එකී ස්ථාන මෙම සංවේදී කලාපයට අදාළ ද යන්න නිරීක්ෂණය වීමකින් තොරව පිළිතුරක් ලබාදිය නොහැකි බව ය.

පැමිණිලිකරු විසින් වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියා කලාපය පැහැදිලි කර දෙමින් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය දැනුවත් කළ පසු අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් ද මේ පිළිබඳව 2018 වසරේ රත්නපුර නාගරික සංවර්ධන අධිකාරී කාර්යාලයේදී පැවති ජංගම සේවයට පැමිණි අවස්ථාවේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව අදාළ නිලධාරීන් විසින් ඉඩම පරීක්ෂා කර බලා නිවස තනා ගැනීමට පානදුර - රත්නපුර ප්‍රධාන මාර්ගයේ සිට අඩි 200ක් නිදහස් කර 2019-2030 නාගරික සංවර්ධන සැලැස්මෙන් එකී කොටස ඉවත් කර අවශ්‍ය කටයුතු සලසා දුන් බව ප්‍රකාශ කළ ද, තවදුරටත් තෙත් බිම් කලාපයක් සඳහා භූමි කොටසක් වෙන් කිරීමේදී ඊට අයත් වන කලාපය හඳුනා ගත් පසු අවශ්‍ය කටයුතු කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුගේ සහනය ලබාදීමට කටයුතු කරන බව ප්‍රකාශ කිරීම වැනි ද්වේශ සහගතව සිදු කරනු ලබන කටයුතු දිගින් දිගටම සිදුවීමෙන් තමාට සහනයක් නොලැබෙන බව පෙනී ගිය බවට පැමිණිලිකරු ප්‍රකාශයක් කර තිබේ.

ඒ අනුව තෙත් බිම් කලාපය සඳහා තම දේපළ ද අත්පත් කර ගනිමින් වන්දි මුදල් ලබාදෙන ලෙස 2022 වර්ෂයේ සිට පැමිණිලිකරු තම ඉල්ලීම වෙනස් කරමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු තම ඉල්ලීම් දිගින් දිගටම ආයතන ගණනාවක් වෙත සිදු කර ඉල්ලා සිටින්නේ තම දේපළ රජයට අත්පත් කර ගැනීමෙන් අනතුරුව අදාළ වන්දි මුදල් ලබාදෙන ලෙස වුවද වගඋත්තරකරුවන් කියා සිටින්නේ, එසේ අත්පත් කර ගැනීමක් සිදු කරන්නේ නම්, ඒ සඳහා පැමිණිලිකරුගේ ලිඛිත එකඟතාවයක් අවශ්‍ය බවත්, රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් ලබාදෙන තක්සේරුගත මුදලක් ලබාදීම සඳහා සළකා බැලියහැකි වුවද කුඹුරු ඉඩමක් වූ බැවින් ඉතා පහළ වටිනාකමක් මේ සම්බන්ධව ගෙවීමට සිදුවිය හැකි බවත් ය.

පැමිණිලිකරු මෙම දේපළ මිලදී ගන්නා ලද්දේ, නිවසක් තැනීමට බව තහවුරු වන අතර එකී නිවස තැනීමේ පරමාර්ථය ඉටු කර ගත නොහැකි වන්නේ 2014 වසරේදී රත්නපුර නගර සංවර්ධන සැලැස්මේදී පරිසර සංවේදී කලාපයක් ලෙස මෙම ප්‍රදේශය නම් කර තිබීම හේතුවෙන් ය.

පැමිණිලිකරු මෙම දේපළ මිලදී ගෙන ඇත්තේ 2013 වසරේදී බව ප්‍රකාශ කරන අතර 2014 වසරේ සිට රත්නපුර පාරිසරික සංවේදී කලාපයට ඇතුළත් කර ඇති බව වගඋත්තරකරුවන් සැලසුම් ඉදිරිපත් කර පෙන්වා දී තිබේ. මෙම දේපල පමණක් නොව වෙනත් දේපල ගණනාවක් තවත් රාජ්‍ය ආයතන ගණනාවක් එක්ව කරන ලද නිරීක්ෂණ වලින් පසුව හඳුනා ගැනීමෙන් පසුව කරන ලද සැලැස්මක් බව ද දේපළ වල නිවාස ඉදි කිරීමට එරෙහිව ගන්නා ලද පියවරක් නොවන බවද වගඋත්තරකාර පාර්ශවය විසින් දක්වා තිබේ.

වගඋත්තරකරු ඉදිරිපත් කළ කරුණු අනුව පෙනී යන්නේ මෙම විෂය ගත දේපළ 2014.10.14 දින අංක : 1884/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් පාරිසරික සංවේදී කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවය. එහෙත් මෙම ලේන්තැඩිය කුඹුර නම් අක්කර දෙකක් පමණ විශාල ඉඩම මුල් අයිතිකරු විසින් කොටස් කර විකිණීමේදී පාරිසරික සංවේදී කලාපයකට වෙන් කළ බව දැනගෙන තිබියදී හෝ නොදැන සිටීමෙන් ඒ පිළිබඳ අවබෝධයකින් තොරව කැබලි කර විකුණා ඇති අතර පැමිණිලිකරු විෂය ගත දේපළ මිලදී ගෙන පසුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ බලපත්‍රය ද ලබාගෙන ඇත. මෙම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ බලපත්‍රය ද පසු කාලීනව අවලංගු කිරීමට කටයුතු කර ඇත්තේ පහත් බිම් ගොඩකිරීම සම්බන්ධව දිගින් දිගටම ලද පැමිණිලි වලින් අනතුරුව බව පෙනී යයි. 2014 වසරේදී ගැසට් ගත කළ නගර සංවර්ධන සැලැස්ම 2017 වසරේදී ආරම්භ කර තිබුණද පැමිණිලිකරුගේ ඉල්ලීම අනුව මෙම කුඹුරු ඉඩම පිහිටි ප්‍රදේශය රත්නපුර - පානදුර ප්‍රධාන මාර්ගයට සමගාමීව මීටර් 200-250 පරිසර සංවේදී කලාපයෙන් නිදහස් කර නැවත ගැසට් ගත කිරීමට තීරණය කර තිබෙන බව නිරීක්ෂණය වේ. 2019.04.02 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඒ බව රත්නපුර මහ නගර සභාවේ නගරාධිපති වෙත දැනුවත් කළ බව වගඋත්තරකරු සිය වාර්තාවෙන් දක්වා තිබේ. එමෙන්ම ඒ සම්බන්ධව ඇති කළ සංශෝධන පිළිබඳව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් හා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව දැනුවත් කරන ලද්දේ පැමිණිලිකරුගේ ඉල්ලීමකට අනුව බව නිරීක්ෂණය වේ.

ඉහත පරිදි පැමිණිලිකරුට සහනයක් ලැබෙන ආකාරයට වගඋත්තරකරු කටයුතු කළ ද මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් අධ්‍යක්ෂ විසින් 2020.10.02 දින කරන ලද ලිඛිත දැනුම්දීමක් අනුව මෙකී විෂය ගත ඉඩම පිහිටි ස්ථානය රාජ්‍ය ආයතන නිලධාරීන් කිහිප දෙනෙකු එක්ව කරන ලද පරීක්ෂණයකින් අනතුරුව නැවත ස්වභාවික සංරක්ෂණ කලාපයට ඇතුල් කර 2021-2030 සඳහා වූ රත්නපුර නගර සංවර්ධන සැලැස්මට ඇතුළත් කර 2021.07.13 දිනැති අංක 2236/07 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව පැමිණිලිකරුට සහනය ලබාගැනීමට තිබූ අවස්ථාව දෙවන වරට ද අහිමි වී ඇත්තේ වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියා කලාපය හේතුවෙන් බව නිරීක්ෂණය වේ. එය නගර සංවර්ධන සැලැස්මට අනුව හෝ පාරිසරික හේතූන් මත ගන්නා ලද තීරණයක් බවට වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කළ හැකි අතර එකී තීරණය ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව ගන්නා ලද තීරණයක් වුවද ඉන් පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බව

නිගමනය කළ යුතුය. පැමිණිලිකරු ඉන් පසුව වන්දි මුදල් ඉල්ලීමේ අවස්ථාවට ප්‍රවේශ වී ඇත්තේ නිවාස අවශ්‍යතාවය ඉෂ්ට කර ගත නොහැකි බැවින් බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් මුල් අවස්ථාවේ 2014 වසරේ සිට නිවාසය තැනීම සඳහා ඉල්ලීම් කළ ද එය ඉෂ්ට නොවන බැවින් පසුව තම විෂය ගත දේපළ රජයට පවරාගෙන ඒ වෙනුවෙන් ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බව පෙනී ගිය ද මෙම දේපළ කුඹුරු ඉඩමක් ලෙස ඔප්පුවේ උපලේඛනයේ තිබීම මත පැමිණිලිකරු අපේක්ෂා කරන ආකාරයේ වන්දි මුදලක් හිමි විය නොහැකි බව ද වගඋත්තරකාර පාර්ශවය පෙන්වා දී තිබේ. ඒ අනුව පැමිණිලිකරුට ගතහැකි විකල්ප ක්‍රියා මාර්ග පිළිබඳවද සොයා බලන ලද අතර එහිදී පෙනී යන ලද්දේ කොන්දේසි ප්‍රකාරව නිවාසයක් තැනීමට අවශ්‍ය පහසුකම සලසා ගැනීම හෝ පැමිණිලිකරු ඉල්ලා සිටින ආකාරයට වන්දි මුදල් ප්‍රදානය කිරීම යන දෙකින් එකක් වෙත පමණක් අවධානය යොමු කළ හැකි බව ය. පැමිණිලිකරු ඉල්ලා සිටින විකල්ප යෝජනා ලෙස ඇත්තේ නිවාස තනා ගැනීමට හැකියාවක් නොමැති බැවින් වෙනත් නිවාසයක් මිලදී ගැනීමට ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදෙන ලෙස හෝ කුඹුරු ඉඩම් සංවර්ධනයට අදාළ සියළු ආයතන සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් මඟින් සංවර්ධන කටයුතු සඳහා එකවර අනුමැතිය ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම් වේ. වගඋත්තරකාර පාර්ශවය ලබාදෙන නිර්දේශය වන්නේ, අනුමත භාවිතයන් සඳහා ඉඩම් හිමියන්ට අවස්ථාව ලබාදීම හෝ ඉඩම රජයට පවරා ගැනීමෙන් පසු වන්දි මුදල් ලබාදීම නිර්දේශයක් ලෙස ඉදිරිපත් කළ හැකි බවය.

තවද නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේදී ප්‍රදේශ වල පවත්නා විවිධ පාරිසරික හා භෞතික සාධක මත සංරක්ෂිත කලාප වෙන් කිරීමක් සිදු කරන බව ද විවිධ ජල ගැලීම් හා ආපදා තත්ත්වයන්ට නිරන්තරයෙන් ලක්වන ප්‍රදේශ හෝ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස හඳුනා ගන්නා කලාප හෝ පාරිසරික සංවේදී ස්ථාන මෙසේ කලාපීයකරණ සැලැස්මකට ඇතුළත් කිරීම හා සංරක්ෂිත ප්‍රදේශ ලෙස නම් කිරීම රත්නපුර ප්‍රදේශය පමණක් මුල් කර ගනිමින් සිදුවන්නක් නොවන බව නිරීක්ෂණය වේ. විවිධ ප්‍රදේශ වල මෙවැනි ආකාරයටම පෞද්ගලික ඉඩම් හා සම්බන්ධ කර ගනිමින් සිදු කර ඇති බව ද අනාවරණය වේ. ඒ අනුව එකී කටයුත්තක් හේතුවෙන් යම් දේපළක් ඊට අදාළ සැලැස්මකට යටත් වීම මෙම අවස්ථාවේ ද පැමිණිලිකරුගේ දේපළ සම්බන්ධව ද සිදුව ඇති අතර එය ද්වේශ සහගතව සිදු කරන්නක් ලෙස සැලකිය හැකි නොවන බව ද පෙනී යයි. නමුත්, පැමිණිලිකරු ප්‍රකාශ කරන ආකාරයට යම් අමනාපකමක් වගඋත්තරකාර ආයතනයේ නිලධාරීන් සමඟ තිබුණේ නම් මෙම අවස්ථාවේ වගඋත්තරකාර නිලධාරී මෙම දේපළ සම්බන්ධව කටයුතු කරන අවස්ථාවන්හි දී එය පැමිණිලිකරුට එරෙහිව ද්වේශ සහගත ආකාරයෙන් කටයුතු කරන අවස්ථාවක් ලෙස පෙනී යාම ද නොවැලැක්විය හැකි එකක් බව නිරීක්ෂණය වේ. එහෙත් සංරක්ෂිත කලාප ලෙස හඳුනා ගන්නා ලද ප්‍රදේශ වල ඉඩම් පවරා ගැනීමක් හෝ වන්දි මුදල් ප්‍රදානය කිරීමක් සිදු කරනු නොලබන බවද එම ප්‍රදේශ පවත්නා අයුරින්ම පවත්වාගෙන යාමට හෝ සංවර්ධන සැලැස්ම විසින් අනුමත කරනු ලබන ආකාරයට භාවිතා කිරීමට ඉඩම් හිමියන්ට අවස්ථාවක් ලබා දීම පමණක් සිදුව ඇති බව විවිධ සංරක්ෂිත කලාප වෙත අවධානය යොමු කිරීමේදී හඳුනා ගතහැකි ලක්ෂණයකි.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.

පැමිණිලිකරු විසින් 2013 වර්ෂයේ දී මිලදී ගත් පෞද්ගලික ඉඩම, 2014 වර්ෂයේදී පාරිසරික සංවේදී කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර එකී දේපළ ස්වභාවික සංරක්ෂණ කලාපයට අයත් බවට ගැසට් නිවේදන නිකුත් කර ඇති බැවින් පැමිණිලිකරු හට තම ඉඩම අහිමි වීමට අදාළව ප්‍රමාණවත් වන්දි මුදලක් කඩිනමින් ලබාදීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2025.07 . 22 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
නාගරික සංවර්ධන හා
නිවාස අමාත්‍යාංශය,
II අදියර, 12 වන මහල,
සෙත්සිරිපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
නාගරික සංවර්ධන හා
නිවාස අමාත්‍යාංශය,
II අදියර, 12 වන මහල,
සෙත්සිරිපාය, බත්තරමුල්ල. - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

එමෙන්ම යම්කිසි ව්‍යාපෘතියක් සංරක්ෂිත කලාප තුළ සිදු කරන්නේ නම් පවත්නා මුදල් ප්‍රතිපාදන මත පවරා ගනිමින් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව වන්දි ගෙවන අවස්ථා ද පවතින බව නිරීක්ෂණය වේ.

මෙ අනුව පැමිණිලිකරුගේ දේපළ නිවසක් තනා ගැනීමේ අරමුණ සඳහා මිලදී ගන්නා ලද දේපළක් බව නිගමනය කළහැකි අතර ලේන්තැඩිය කුඹුර නම් පුරන් වූ කුඹුරු යාය කොටස් කර අලෙවි කිරීමේදී හෝ අලෙවි කිරීමෙන් පසු ආසන්න කාලයකදී පරිසර සංවේදී කලාපයක් ලෙස හඳුනා ගන්නා ලද නගර සංවර්ධන සැලැස්මට යටත් ස්ථානයක් බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට නිවාසයක් තනා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම සැලසෙන ආකාරයට කලාපීය සංවර්ධන සැලැස්ම සංශෝධනය කළ ද පසුව නැවත රත්නපුර තෙත් බිම් උද්‍යානයක් වෙනුවෙන් වූ ව්‍යාපෘතියක් හෝ ස්ථානයක් සඳහා නැවත මෙම ප්‍රදේශය හඳුනා ගැනීම මත පැමිණිලිකරුට දෙවන වරට ද නිවස තැනීමට ඇති අවස්ථාව අහිමි වී තිබෙන බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට නැවත නිවසක් තැනීම සඳහා මෙම ස්ථානය භාවිතා කිරීමේ අවස්ථාව අහිමි වී ඇති බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම දේපළ වගඋත්තරකාර පාර්ශවයේ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අත්පත් කර ගනිමින් වන්දි මුදල් ගෙවීම සුදුසු බව නිරීක්ෂණය වේ.

එමෙන්ම මෙම දේපළ සම්බන්ධව රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වන්දි නියම කිරීමේදී මෙම දේපලේ අතීත භාවිතය කුඹුරක් ලෙස තිබුණ ද වර්තමානය වන විට කුඹුරු ඉඩමක් නොමැති බැවින් කුඹුරු ඉඩමකට අදාළ තක්සේරුවක් කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව ද පෙනී යයි.

ඒ අනුව පැමිණිලිකරු 2013 වසරේ දී මිලදී ගෙන ඇති පෞද්ගලික ඉඩම, වගඋත්තරකාර පාර්ශවය විසින් 2014.10.14 දින අංක : 1884/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් පාරිසරික සංවේදී කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර නැවතත් එකී දේපළ ස්වභාවික සංරක්ෂණ කලාපයට ඇතුළු කර 2021-2030 සඳහා වූ රත්නපුර නගර සංවර්ධන සැලැස්මට ඇතුළත් කර 2021.07.13 දිනැති අංක 2236/07 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර තිබිය දී එකී ඉඩම රජය වෙත පවරාගෙන සුදුසු පරිදි ඒ සඳහා වන්දි මුදලක් ප්‍රධානය කිරීමට කටයුතු නොකිරීම තුළින් පැමිණිලිකරු හට 2014 වසරේ සිට මේ දක්වා එකී ඉඩමේ නිවසක් තනා දිවි ගෙවීමට තිබූ අවකාශය අහිමි වී ඇති නමුත්, එකී පාරිසරික සංවේදී කලාපයට අයත් බවට ප්‍රකාශයට පත් කර ඇති වෙනත් ඉඩම් තුළ නිවාස ඉදිකිරීමට වගඋත්තරකරකාර පාර්ශවය විසින් අවසර ලබාදී ඇති බව පැමිණිලිකරු පෙන්වා දී ඇති බැවින් හා වර්තමානයේ ද එම නිවාසවල හිමිකරුවන් පදිංචිව වාසය කරන බව වාර්තා වන හෙයින් පැමිණිලිකරු සම්බන්ධයෙන් කිසිදු සහනයක් ලබා දීමට කටයුතු නොකිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව තුළින් ආරක්ෂා කර ඇති පැමිණිලිකරුගේ සර්ව සාධාරණත්වයේ හා සමානාත්මතාවයේ අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.